# ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ - 2022

ශ්‍රී ලාංකේය විද්‍යුත් සන්නිවේදනයේ ගුවන්විදුලියට ඇත්තේ දශක නවයක ඉතිහාසයකි. එකී මාධ්‍ය නියුක්තියන් රාජ්‍ය මට්ටමින් අගයනු වස් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ගුවන්විදුලි උපදේශක සභාව මගින් සංවිධාන කරනු ලබන ‘‘ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල - 2022’’ මෙවරද ජාත්‍යන්තර ගුවන්විදුලි දිනට සමගාමීව උත්කර්ෂවත්ව පැවැත්වීමට තීරණය කර තිබේ. පවතින කෙරෝනා වසංගත සමයේ අභියෝග මධ්‍යයේ වුවද තත්කාර්ය ඉටු කිරීම අදාළ අංශ වල වගකීම ලෙස සලකමු.

**තරග අංශ**

## 01. ප්‍රවෘත්ති හා කාලීන

1.1 ප්‍රශස්ත ප්‍රවෘත්ති සංස්කාරක

1.2 ප්‍රශස්ත ප්‍රවෘත්ති ප්‍රකාශක (පිරිමි)

1.3 ප්‍රශස්ත ප්‍රවෘත්ති ප්‍රකාශක (ගැහැනු)

1.4 ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව

1.5 ප්‍රශස්ත ප්‍රාදේශීය ප්‍රවෘත්ති වාර්තාව

## 02. හොඳම ගුවන්විදුලි වැඩසටහන්

(අධ්‍යාපනික, ආගමික, ළමා, කාන්තා, සෞඛ්‍යය, පරිසරය, ජාතික සංවර්ධනය හා ජාතික සමගිය, සංස්කෘතික හා කලා තේමා යටතේ නිෂ්පාදිත වැඩසටහන් මේ සඳහා ඉදිරිපත් කළ හැකිය.)

2.1 ප්‍රශස්ත සජීවී උදා වැඩසටහන (Morning Drive )

2.2 ප්‍රශස්ත සජීවී සන්ධ්‍යා වැඩසටහන (Evening Drive)

2.3 ප්‍රශස්ත සම්මුඛ සාකච්ඡා වැඩසටහන (Interview)

2.4 ප්‍රශස්ත සාකච්ඡා වැඩසටහන (Discussion) (තිදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ සහභාගි වන වැඩසටහන්)

2.5 ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන

2.6 ප්‍රශස්ත සංගීත වැඩසටහන

2.7 ප්‍රශස්ත ක්‍රිඩා වැඩසටහන (ක්‍රීඩා සඟරා සහ සජීවී විකාශන ද මේ සඳහා සලකා බලනු ලැබේ)

## 03. ගුවන්විදුලි නාට්‍ය

3.1 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය රචක (**පිටපත් රචකයා** සම්මානය සඳහා නිෂ්පාදකවරයා විසින් නම් කළ යුතු අතර, අනිවාර්යයෙන් පිටපත අමුණා තිබිය යුතුය.)

3.2 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය ශිල්පියා

3.3 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය ශිල්පිනිය

3.4 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය නිෂ්පාදක

3.5 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය (ළමා) රචක (**පිටපත් රචකයා** සම්මානය සඳහා නිෂ්පාදකවරයා විසින් නම් කළ යුතු අතර අනිවාර්යයෙන් පිටපත අමුණා තිබිය යුතුය.)

3.6 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය ශිල්පියා (ළමා)

3.7 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය ශිල්පිනිය (ළමා)

3.8 ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය නිෂ්පාදක (ළමා)

## 04. ගුවන්විදුලි ශබ්ද තාක්ෂණය හා ප්‍රචාරණය

4.1 ප්‍රශස්ත නාද ශික්ෂණය

4.2 ප්‍රශස්ත පූර්ව ප්‍රචාරණ ඛණ්ඩය

4.3 ප්‍රශස්ත කිංකිනි රාව (Best Jingles) (අංක 4.3 සහ 4.4 පැහැදිලිව තේරුම් ගෙන අයදුම් කළ යුතුය.)

4.4 ප්‍රශස්ත නිර්මාණශීලී රේඩියෝ වෙළෙඳ දැන්වීම (Advertisement)

## 05. ස්වර්ණ සංකථන සම්මාන

5.1 ප්‍රශස්ත රේඩියෝ සන්නිවේදක (පිරිමි)

5.2 ප්‍රශස්ත රේඩියෝ සන්නිවේදක (ගැහැනු)

5.3 ප්‍රශස්ත බාහිර විස්තර කථක

## <u>තරග කොන්දේසි සහ උපදෙස්</u>

01. මෙම සම්මාන උලෙළ සඳහා නිර්මාණ ඉදිරිපත් කළ හැක්කේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවක ප්‍රචාරය වූ වැඩසටහන් පමණි.

02. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුන සඳහාම සම්මාන පිරිනමනු ලැබේ.

03. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කොට ප්‍රචාරය කරන ලද වැඩසටහන් පමණක් ඉදිරිපත් කළ හැකි අතර, **2020 වර්ෂයේ ජූලි මස 01 වන දින සිට 2021 වර්ෂයේ ජූනි මස 30** වන දින දක්වා කාලය තුළ ප්‍රචාරය වූ වැඩසටහන් පමණක් සුදුසුකම් ලබයි.

04. තරග අයදුම්පත ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය. නැතහොත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ www.culturaldept.gov.lk යන ලිපින මගින් අයදුම්පත් බාගත (download) කරගත හැකිය.

05. නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතනික ප්‍රධානියාගේ/නියෝජිතයාගේ නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතුය.

06. ගුවන්විදුලි රාජ්‍ය සම්මාන තරගය සඳහා නිර්මාණ භාරගන්නා අවසාන දිනය 2022 **ජනවාරි** 20 වැනි දින ප.ව. 3.00 ට වන අතර, මෙදිනට පෙර අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට පැමිණ හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකිය.

07. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ගුවන්විදුලි වැඩසටහන් සංයුක්ත තැටියක් ලෙස භාර දිය යුතුය. අයදුම් පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර **" ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ - 2022"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08. පිටපත් රචනය, ගීත ප්‍රබන්ධන හෝ වෙනත් පිටපත් රචකයන්ගේ විස්තර නිෂ්පාදකවරයා විසින් අනිවාර්යයෙන් අයදුම්පතට ඇතුලත් කරනු ලැබිය යුතුය.

09. ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළට සම්බන්ධ පිරිස් සහ එම පවුල්වල සාමාජිකයන්ට මේ තරගය සඳහා සහභාගි විය නොහැකිය.

10. එක් එක් ප්‍රවර්ගය සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතු වන අතර, එක් ප්‍රවර්ගයකින් (Category) එක් ඉල්ලුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් වැඩසටනක් පමණි.

11. ප්‍රධාන සම්මානවලට අමතර නිර්මාණශීලි දායකත්ව සඳහා ජූරියේ විශේෂ සම්මාන හා විශිෂ්ට කුසලතා සම්මාන පිරිනැමීම සඳහා සලකා බැලේ.

12. ප්‍රශස්ත රේඩියෝ නාට්‍ය පිටපත සහ ප්‍රශස්ත ප්‍රවෘත්ති සංස්කාරක සඳහා ඉල්ලුම් කිරීමේදී සංයුක්ත තැටිය සමග අදාළ පිටපත ඉදිරිපත් කළ යුතුය. (සංයුක්ත තැටි නිසි පරිදි පටිගත වී ඇත්දැයි පරික්ෂා කර යොමු කළ යුතුය.)

13. කිසියම් තරග ප්‍රවර්ගයක් යටතේ තෙවරක් ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා තරගකරුවෙකුට තුන්වන අවස්ථාවේදී පිරිනමනු ලබන්නේ රජත සම්මානයයි. ඉන් පසු ඔහුට හෝ ඇයට හෝ එම තරග ප්‍රවර්ගය යටතේ නිර්මාණ ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත. එහෙත් වෙනත් තරග අංශවලට ඉල්ලුම් කිරීමට අවකාශ තිබේ.

14. තරගය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් හා සංයුක්ත තැටි ආපසු ලබාදීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව බැඳී නොසිටි.

15. සියලු නිර්මාණ තේරීම ජාතික තලයේ ස්වාධීන, ප්‍රවීණ විද්වත් කමිටුවක් මගින් සිදු කරනු ලබන අතර, ජයග්‍රාහී නිර්මාණ තෝරා ගැනීම පිළිබඳ එම කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

16. තරගය සඳහා ඉදිරිපත්වීම ම සියලු තරග කොන්දේසිවලට එකඟවීමක් සේ සැලකේ.

17. ගුවන්විදුලි සම්මාන උලෙළ සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය තීරණ සහ අවසාන වගකීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ.

18. සම්මාන උලෙළ පිළිබඳ ආයතනයේ අදාළ අංශ දැනුවත් කිරීම ආයතන ප්‍රධානියාගේ, අංශ ප්‍රධානීයා හා අදාළ නිලධාරීන් සතුය.

## <u>තරගය සඳහා ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි අවස්ථා</u>

I. නිසි පරිදි සම්පුර්ණ නොකරන ලද අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි අයැදුම්පත් පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. සංයුක්ත තැටි උසස් තාක්ෂණික මට්ටමින් තිබිය යුතු අතර, ශ්‍රව්‍ය ගෝචර නොවන අවස්ථාවල දී විනිශ්චය සඳහා ඉදිරිපත් නොකරනු ඇත

තරණි අනෝජා ගමගේ
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

විමසීම් - ගුවන්විදුලි ප්‍රවර්ධන අංශය - 011-2872044 - 011-2872031 (සමන්ත / දිල්රුක්ෂි)